# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2240/34 - 2021 අගෝස්තු මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2021.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/04/2018/204.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මයා,<br>
අංක 113, සදහම් මාවත,<br>
වල්පොල,<br>
අංගොඩ.

*සහ*

මාර්ග සංවර්ධන අධිකාරිය,<br>
''මඟ නැගුම මහමැදුර'',<br>
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
කොස්වත්ත,<br>
බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

1A - G 34839 — 30 (2021/08)

මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

දෙමෝදර,
නා උල්ල,
පන්සල පාර,
225,
ඩබ්. එම්. සෙනවිරත්න වීරසිංහ මයා

පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී.

08-429/1

---

මගේ අංකය : IR/COM/04/2018/204.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මයා,
අංක 113, සදහම් මාවත,
වල්පොල,
අංගොඩ.

*සහ*

මාර්ග සංවර්ධන අධිකාරිය,
''මග නැගුම මහමැදුර'',
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත,
බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

''මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ අධිකාරි ප්‍රවාහන ලෙස සේවය කළ ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතාට යාන්ත්‍රික ඉංජිනේරු තනතුර හිමි ද යන්න හා හිමිනම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතාට හිමි සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

08-429/2

මගේ අංකය : IR/COM/01/2016/176.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත 4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2212/12 වන දින අංක 2021.01.26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2021.01.01 වැනි දින දරන නියෝගයෙන්,

අයි. නිමල් කරුණාතිලක මයා,
අංක 259,
5 වන පටුමග,
උයන්දන වත්ත,
මල්ලවපිටිය,
කුරුණෑගල.

*සහ*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

අතර පවත්නා 2020.12.31 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සී. ගනිගල්ගොඩගේ මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් හා කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2021.01.01 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2021 අගෝස්තු මස 04 දින,
කොළඹ දීය.

08-430/1

---

මගේ අංකය : IR/COM/01/2016/176.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

අයි. නිමල් කරුණාතිලක මයා,
අංක 259,
5 වන පටුමග,
උයන්දන වත්ත,
මල්ලවපිටිය,
කුරුණෑගල.

*සහ*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

බදුල්ල,
මීගහකිවුල,
පේරගස්වත්ත,
නීතිඥ වීරකුට්ටි දියුණුගේ සරත් ජයරත්න වීරසිංහ මයා,

පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 අගෝස්තු මස 04 දින,
කොළඹ දී ය.

08-430/2

---

මගේ අංකය : IR/COM/01/2016/176.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

අයි. නිමල් කරුණාතිලක මයා,
අංක 259,
5 වන පටුමග,
උයන්දන වත්ත,
මල්ලවපිටිය,
කුරුණෑගල.

*සහ*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවකයෙකු වූ අයි. නිමල් කරුණාතිලක මහතාට විරුද්ධව පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව පනවන ලද දඬුවම යුක්ති සහගත ද යන්න සහ එසේ නොවේ නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 අගෝස්තු මස 03 දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08-430/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.